# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2021 ජූලි මස 16 වැනි සිකුරාදා - 2021.07.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**අංක 2,236 - 2021 ජූලි මස 09 වැනි සිකුරාදා ගැසට් පත්‍රයේ පළ වූ තනතුරු - ඇබෑර්තු**

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල**

**පුරප්පාඩු**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රෝහල වෙත පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන් - විශේෂ ශ්‍රේණිය**

- විකිරණ ශිල්පී (රෝග විනිශ්චය)
- විකිරණ ශිල්පී චිකිත්සක
- වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී
- භෞත චිකිත්සක
- ඖෂධවේදී
- අක්ෂි තාක්ෂණවේදී

*සුදුසුකම් :*

(i) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සහ*

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සේවය කර ඇත්නම් අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සියල්ල සමත් වී තිබීම හා වැටුප් වර්ධක (10)ක් උපයාගෙන තිබීම.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 8 - රු. (50,970 - 10 x 1,385 - 8 x 1,910 - රු. 80,100)

* වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තින් විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 3 හි තබනු ලැබේ. - රු. 53,740.00

2. **හෙද පාලිකා - (විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි)**

*සුදුසුකම් :*

i. විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

*සහ*

ii. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමණාකරන හා අධීක්ෂණය / ඉගැන්වීම සහ අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම් හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර (05) ක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම ;

*සහ*

iii. තෙවැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම ;

*සහ*

iv. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

*සහ*

v. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමකට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

*වයස් සීමාව :* අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 8 - රු.: 50,970 - 10 x 1385 - 8 x 1910 - 80,100

* හෙද පාලිකා - විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 4 හි තබනු ලැබේ.- රු. 55,125.00

3. **හෙද සොහොයුරිය**

සුදුසුකම් :

i. I වන ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

*සහ*

ii. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වූ නිලධරයෙකු වීම.

*සහ*

iii. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වී තිබීම ;

*සහ*

iv. පූර්වාසන්නතම වසර (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

*සහ*

v. අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්මට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

*වයස් සීමාව :* අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 7 - රු. (33,295 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 59,805)

* හෙද සොහොයුරිය MT 7 පියවර 23 හි තබනු ලැබේ. - රු. 45,735.00

4. **හෙද නිලධාරි**

සුදුසුකම් :

i. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම ;

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව හෝ ගණිතය හෝ කෘෂි විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම ;

*සහ*

iii. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : MT 7 - රු.(33,295 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 59,805)

* හෙද නිලධාරි MT 7 පියවර 01 හි තබනු ලැබේ.

5. **ඖෂධවේදී**

*සුදුසුකම් :*

i. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

*සහ*

iii. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන ඖෂධවේදී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

*සහ*

iv. (අ) ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*හෝ*

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව* : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය:* MT 6 - රු.(32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

* ඖෂධවේදී MT 6 පියවර 01 හි තබනු ලැබේ.

6. **විකිරණ ශිල්පී (චිකිත්සක)**

*සුදුසුකම් :*

i. සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අගෝස්තු මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයයන් දෙකක් එකවර සමත් වීම.

*සහ*

iii. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරිමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ විකිරණ ප්‍රතිකාරකවේදී / විකිරණ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විකිරණ ශිල්පී දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

*සහ*

iv. (අ). විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

*හෝ*

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් විකිරණ ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

* විකිරණ ශිල්පී (චිකිත්සක) MT 6 පියවර 01 හි තබනු ලැබේ.

7. **වෘත්තීය චිකිත්සක**

*සුදුසුකම් :*

i. සිංහල/ දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට (4) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (6) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් (2) ක් එකවර සමත් වීම.

*සහ*

iii. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෘත්තීය චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම.

*හෝ*

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වෘත්තීය චිකිත්සක දෑ අවුරුදු ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

*සහ*

iv. (අ). වෘත්තීය චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

*හෝ*

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් වෘත්තීය චිකිත්සකයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

* වෘත්තිය චිකිත්සක MT 6 පියවර 01 හි තබනු ලැබේ.

8. **දන්ත කාර්මික ශිල්පි**

සුදුසුකම් :

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් දෙකක් (02) එකවර සමත් වීම.

සහ

iii. පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨය/ සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දන්ත කාර්මික ශිල්පි දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

iv. ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

* දන්ත කාර්මික ශිල්පි MT 6 පියවර 01 හි තබනු ලැබේ.

9. **අක්ෂි තාක්ෂණවේදී**

සුදුසුකම් :

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් දෙකක් (02) එකවර සමත් වීම.

සහ

iii. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේදි දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

iv. (අ) අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

(ආ) විදේශ උපාධියක් ලබා ඇති අයෙක් නම් අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

* අක්ෂි තාක්ෂණවේදීMT 6 පියවර 01 හි තබනු ලැබේ.

10. **සෘජුනේත්‍රඥ**

*සුදුසුකම් :*

i. අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි ස්ථිර කරන ලද නිලධාරියෙකු විම.

සහ

ii. අදාළ තනතුරේ II වන ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහළ නිලධාරියෙකු විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට අඛණ්ඩ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

iii. ශ්‍රී ලංකා අක්ෂි රෝහල මගින් පවත්වනු ලබන මාස 06 ක සෘජු නේත්‍රඥ පුහුණුව සම්පූර්ණ කර අවසන් විභාගය සමත් වී තිබීම.

සහ

iv. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 6 - රු. (32,850 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 59,360)

* සෘජු නේත්‍රඥ MT 6 පියවර 01 හි තබනු ලැබේ.

11. **පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී**

*සුදුසුකම් :*

i. සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුව දෙවරකට නොවැඩි වාර ගණනකදි විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනක් එක්වරකදී සමත් වීම.

සහ

iii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාළව සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 1/2) පූර්ණ කාලීන වෘත්තීමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

සහ

iv. කාන්තා පක්ෂයට පමණක් අයදුම් කළ හැක.

*වයස් සීමාව :* අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :* MT 5 - රු. (32,405 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 58,915)

* පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී MT 5 පියවර 01 හි තබනු ලැබේ.

**පොදු කොන්දේසි :**

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
5. මෙම තනතුරු ස්ථිර වන අතර, විශේෂ ශ්‍රේණියේ නොවන තනතුරු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර විශේෂ ශ්‍රේණියේ තනතුරුවල රාජ්‍ය සේවයෙහි රැකියාවක නියුතුව සිටි නිලධාරින් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.
6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව).
7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2021.07.25 දිනට හෝ ඊට පෙර ''විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල, රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර'' යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය
8. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.
9. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ අදාළ ආකෘතියට අනුකුල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
10. අයදුම්පත් භාගත කර ගැනීමට/ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.

www.kdu.ac.lk

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

07-382

---

**අංක 2,237 - 2021 ජූලි මස 16 වැනි සිකුරාදා ගැසට් පත්‍රයේ පළ වූ තනතුරු - ඇබෑර්තු**

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙහි නීති නිලධාරී (විධායක සේවා ගණයේ III ශ්‍රේණිය) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2021

අමාත්‍ය මණ්ල කාර්යාලයෙහි විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03)කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය හා සහතික කරන්නාගේ නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.) ;

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු, පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම :

(අ) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු සහ නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම.

(ආ) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු.

(ඇ) අදාළ අණපනත් සම්බන්ධ නෛතික කටයුතු.

(ඈ) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු.

(ඉ) විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

(මෙම කරුණු ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයක් මගින් සනාථ කළ යුතුය)

(iii) කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත් සුදුසුකම් :

* අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
* විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
* යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.
* අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය, තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවාගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2020.10.16 දිනැති අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව අදාළ රාජ්‍ය භාෂාවේ/භාෂාවන්හි ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**4. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

5. වැටුප් පරිමාණය :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL 1-2016) වේ.

**6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ :**

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 25 |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද : | | |
| | * පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | * දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | * පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | * සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | සටහන I: නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ලකුණු 05ක් ලබා දෙනු ලැබේ.<br>සටහන II: ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| 02 | 02 අතිරේක වෘත්තීය පළපුරුද්ද : | | 35 |
| | අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 2. (ii) හි සඳහන් ස්වභාවයේම අතිරේක පළපුරුද්ද | | |
| | (මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන වසර 03ක පළපුරුද්ද හැර) | | |
| | - එක් වසරකට ලකුණු 07 බැගින් උපරිම : ලකුණු 35<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු කාලයකට : ලකුණු 03 | | |
| | * අවුරුදු 15කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද (මෙම සේවා කාලය අයදුම්කරු වෙනුවෙන් නිකුත් කරනු ලබන සහතිකය තුළම සඳහන් කළ යුතුය) නීතිඥවරයෙකුගෙන් හෝ අධිකරණ සේවයේ නිලධරයකුගෙන් හෝ ලබා ගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය. | | |
| | * රජයේ හෝ පෞද්ගලික අංශයේ නිලධරයකු ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තේ නීතිමය තනතුරක සේවය කරන කාලය තුළ බව අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධාන සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය. | | |
| 03 | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :** | | 10 |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා. | 10<br>08 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාලාවක්. | 05 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 04 | |
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් පුහුණු/වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.<br>සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| 04 | **භාෂා හැකියාව :** | | 15 |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය. | 15 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පශ්චාත් නීති ඩිප්ලෝමාවක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම. | 12<br>10 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS (Academic) සමස්ත ලකුණු 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT ලකුණු 79 හෝ ඊට ඉහළ TOEFL-CBT ලකුණු 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT ලකුණු 550 හෝ ඊට ඉහළ වීම. | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබා ගත් NVQ 4 මට්ටමේ සහතිකයක්.<br>සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව :** | | 15 |
| | i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය | 05 | |
| | ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම. | 05 | |
| | iii. පැහැදිළිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව හා පෞරුෂත්වය. | 05 | |
| | **එකතුව** | | **100** |

**සටහන :** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්‍රවල අදළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතික පත්‍රවලට අදළ කාල සීමාවන් අදළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාල සීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සඳහා සලකා බලනු නොලැබේ.

**7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

(i) අයදුම්පත් **2021 අගෝස්තු මස 23 වැනි** දිනට හෝ ඊට ප්‍රථම "අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, ජනරජ ගොඩනැගිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුවට අංක 1.1 සිට 3.5 දක්වාත්, දෙවැනි පිටුවට 4.0 සිට 5.0 දක්වාත් තෙවැනි පිටුවට 6.0 සිට 8.0 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයයෙකු/සමාදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 47,615ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

9. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරන අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2021 ජූලි මස 07 වැනි දින,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

**ආදර්ශ අයදුම් පත්‍රය**

අමාත්‍ය මණ්ඩල කාර්යාලය

**නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවා ගැනීම**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2/දෙමළ - 3/ඉංග්‍රීසි - 4

**සටහන :** අයදුම්කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

01. 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.2 සම්පූර්ණ නම:————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2.3 දුරකතන අංකය :

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 / ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1 / අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 උපන් දිනය වර්ෂය : මාසය : දිනය :

3.4 2021.08.23 වැනි දිනට වයස : අවුරුදු : මාස : දින :

3.5 ජාතික හැඳුනුම්පත් අංකය :

4.0 4.1 අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

| *සුදුසුකම* | *ලබාගත් ආයතනය* | *සුදුසුකම් වලංගුවන දිනය* |
|---|---|---|
| .................................................. | ............................................... | ........................................ |
| .................................................. | ............................................... | ........................................ |

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය : .....................................

4.2 අයදුම්පත කැඳවීමේ නිවේදනයේ අංක 6 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :

| | *සුදුසුකම* | *ලබාගත් ආයතනය* | *සුදුසුකම් වලංගුවන දිනය* |
|---|---|---|---|
| (අ) අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | | |
| | .................................................. | ........................................... | ........................................ |
| | .................................................. | ........................................... | ........................................ |
| (ආ) අතිරේක වෘත්තීය පළපුරුද්ද : | | | |
| | .................................................. | ........................................... | ........................................ |
| | .................................................. | ........................................... | ........................................ |
| (ඇ) භාෂා හැකියාව : | | | |
| | .................................................. | ........................................... | ........................................ |
| | .................................................. | ........................................... | ........................................ |
| (ඈ) තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : | | | |
| | .................................................. | ........................................... | ........................................ |
| | .................................................. | ........................................... | ........................................ |

5.0 ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

පිළිතුර "ඔව්" නම් විස්තර කරන්න

6.0 අයදුම්කරුගේ සහතිකය.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

.............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .....................................................

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................ මහතා/මහත්මිය/මෙනෙවිය හා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ වව ද, සහතික කරමි.

.........................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය : ..................................
සම්පූර්ණය නම : ..................................................................
තනතුර : ..........................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

8.0 අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රාජ්‍ය සේවයේ නිලධාරින් සඳහා පමණි.)

ඉහත විස්තර සඳහන් ....................................................... මහතා/මහත්මිය/මෙනෙවිය ............................................. අමත්‍යාශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණිම සතුටුදයක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහන් කළ හැකි බවත් සහතික කරමි.

..................................................................
අමාත්‍යාංශ ලේකම්ගේ/
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ..................................
නම : ..................................................................
පදවි නාමය : ..........................................................................
(නිල මුද්‍රාව තබන්න.)

07 - 423

---

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ඇබෑර්තු

**මෝටර් කාර්මික තනතුර**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින "මෝටර් කාර්මික" තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් **2021 අගෝස්තු මස 06 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලෙකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "මෝටර් කාර්මික තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.Parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය.)

1. **වැටුප් පරිමාණය :**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 30,350 - 11 x 330/10 x 380 - 37,780 වේ. එබැවින්, තෝරාගන්නා අයදුම්කරුවන් පත්වීමේ දිනසිට ක්‍රියාත්මක වන පරිදි රු. 30,350ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 66,500 පමණ වේ)

2. **අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන් ද, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී තිබීම.

3. **වෘත්තීය සුදුසුකම් :**

ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මගින් හෝ රජයේ/පිළිගත් පෞද්ගලික ආයතනයක් මගින් පවත්වනු ලබන මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වසර 3කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකොට තිබීම.

සහ

සියලුම වර්ගවල වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම.

(මෝටර් කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ Level 4 හෝ ඉහළ මට්ටමේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ)

4. **පළපුරුද්ද :**

රජයේ/පිළිගත් පෞද්ගලික ආයතනයක මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ වසර පහකට නොඅඩු කාලයක් සේවය කර තිබීම.

5. **වයස් සීමාව :**

අයදුම්පත් භාර ගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

6. **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

7. සේවා නියමයන් හා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මුල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතකයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරාෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
   (අ) උප්පැන්න සහතිකය.
   (ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
   (ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
   (ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

9. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

10. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2021 ජූලි මස 16 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම් පත්‍රය

**මෝටර් කාර්මික තනතුර**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..............................................................................
..............................................................................
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..............................................................................
..............................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (*Mr/Mrs/Miss*) ..............................................................................
..............................................................................
..............................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

03. (අ) පෞද්ගලික ලිපිනය : ..............................................................................
..............................................................................
දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
(ආ) කාර්යාලයීය ලිපිනය : ..............................................................................
..............................................................................
දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :
පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

05. විවාහක/අවිවාහක බව : (විවාහක/අවිවාහක)

06. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී/පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතුය)

| *විභාගය* | *විෂයය* | *සාමාර්ථයන්* | *සමත්වූ වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස. (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතු ය)
..............................................................................
..............................................................................

10. වෙනත් සුදුසුකම් : (සහතික පිටපත් ඇමිණිය යුතුය)
..............................................................................
..............................................................................

11. පළපුරුද්ද : (සහතික පිටපත් ඇමිණිය යුතුය)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය : ..............................................................................
(ආ) මුල් පත්වීමේ දිනය : ..............................................................................
(ඇ) දැනට දරන තනතුර : ..............................................................................
(ඈ) මාසික මූලික වැටුප : ..............................................................................
(ඉ) දීමනා : ..............................................................................
